**මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලවආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.5,298,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | ආයතනයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ඒවා ලැබෙන අවස්ථාවේදීම අයවැය වෙන් කිරීම තුළ දැක්වෙන ප්‍රාග්ධන ලැබීම් ගිණුම්වලට වෙන වෙනම හඳුනාගෙන ගිණුම් තබනු ලබයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.5,346,000 ක් වූ පරිගණක යන්ත්‍ර අත්පත් කර ගෙන තිබුණු නමුත් සැපයුම්කරු වෙත වර්ෂය තුළදී ගෙවා තිබුණු රු.4,276,800 ක් පමණක් ගිණුම් ගත කර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ සහ ණයහිමියන් රු.1,069,200 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | මිලදීගත් පරිගණක සම්බන්ධයෙන් එහි වටිනාකම නිවැරදිව ගිණුම් තැබීමට සටහන් තබාගන්නා ලදී. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවා තිබුණු රු.1,013,731 ක්, මෙහෙයුම් වියදමක් ලෙස සලකා ලාභයට එරෙහිව කපා හැර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | ඔබ විසින් පෙන්වා දී ඇති රු.1,013,731.00 වටිනාකමට අදාල මිලදී ගැනීම් වලින් සමහර අයිතම පමණක් ප්‍රාග්ධන අයිතම වන බව නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු.262,020.00 ක් වේ. ඉතිරි වටිනාකම පුනරාවර්තන වියදම් වලට අදාල වේ. මේ අනුව අදාල ගැළපීම් කිරීමට සටහන් තබා ගන්නා ලදී. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු අතර මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 හා 2018 වර්ෂවල ප්‍රත්‍යාගණිත වත්කම්වලට අදාළ රු.5,069,933 ක් වූ ක්ෂය, ක්ෂය ගිණුමට හර කිරීම වෙනුවට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට හර කර තිබීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිත ගිණුම හා පොදු සංචිත ගිණුම ඊට සමාන අගයකින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | 2017 හා 2018 වර්ෂ වල ප්‍රත්‍යාගණිත වත්කම් වලට අදාල ක්ෂය ප්‍රමාණය නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා සටහන් තබා ගන්නා ලදී. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් රු.7,678,951 ක් මූල්‍ය නොවන ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ ඌනතාවයට ගලපා, සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ගෙවා තිබුණු පාරිතෝෂික රු.2,083,888 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවද, ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය තුළදී පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ඇතිවී තිබුණු වෙනස රු.3,177,113 ක් මූල්‍ය නොවන ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ ඌනතාවයට ගලපා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට සටහන් තබා ගන්නා ලදී. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී සීමිත අරමුදල් (Restricted Fund) ගිණුමට මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිවෙලින් මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවද, ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය තුළදී එම ගිණුමේ ඇතිවී තිබුණු වෙනස රු.8,319,954 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට සටහන් තබා ගන්නා ලදී. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂකට වැඩි කාලයක් පැරණි එකතුව රු.8,839,815 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබීම, ආයතනය සතුව වෙනත් උපයාගත් ආදායම් නොමැති වීම යනාදී හේතු දැක්විය හැක. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 අංක 16දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45(1)(2)xv වගන්තිය | 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ වෙනත් අරමුදල් 12 ක පැවති එකතුව රු.42,781,072 ක් වූ මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රමාණවත් මුදලක් නොලැබීම නිසා 2017 වසරේ සිට මේ දක්වා ආයතනය වෙත තිබූ වෙනත් අරමුදල් සියල්ල ප්‍රයෝජනයට ගැනීමට සිදු වී ඇත.<br><br>ඔබ විසින් පෙන්වා දී ඇති රු.42,781,072.00 ක මුදලක් ඒ ඒ අරමුදල් ගිණුම්වල ශේෂ ලෙස පෙන්නුම් කළද එම මුදල් සත්‍ය වශයෙන් ගිණුම්වල නොමැති වීම නිසා එසේ ආයෝජන කටයුතුවල යෙදවීමට නොහැකි වී ඇත. | විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,900,166 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,564,284 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,335,882 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, පෞද්ගලික පඩිනඩි වියදම රු.34,373,048 කින් වැඩිවීම, ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.1,221,100 ක් වූ තීන්ත හා ග්‍රවුට් ද වෛද්‍ය මධ්‍යස්ථානය සතුව පැවති පිරිවැය රු.35,564 ක් වූ ඖෂධ තොග ද කල්ඉකුත් වී තිබුණි. | ඖෂධ භාවිතයට නොගැනීමට හේතු වී ඇත්තේ 2020/2021 වසර වල පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ආයතනය වෙත සිසුන් නොකැඳවීම හා වරින්වර කාර්යමණ්ඩලය සඳහාද ආයතනය වසාදැමීම නිසාය.<br><br>ICC ආයතනය මගින් භාරදුන් මෙම තොගය සම්බන්ධයෙන්ද කමිටු නිර්දේශය මත කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | අවශ්‍යතාවය අනුව තොග මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් හා බැඳුම්කර කඩ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.10, 557,026 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කඩකොට ඇති ගිවිසුම් හා බැඳුම්කර වෙනුවෙන් ආයතනයට අයවිය යුතු මුදල් අයකිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු වෙමින් පවතී. | අදාල මුදල් අයකර ගැනීමට නොපමාව පියවර ගත යුතුය. |
| (ආ) තක්සේරු වටිනාකම රු.175,376,800 ක් වූ තාක්ෂණික ආයතනය ස්ථාපනය කර ඇති භූමිය, නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරා ගැනීම සඳහා 2009 නොවැම්බර් 29 වන දින රු.25,000,000 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එකී මුදල් ගෙවූ දින සිට වාර්තාවේ දිනය දක්වා වසර 12 ක කාලයක් ගතවී තිබුණද ඉඩමේ අයිතිය පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් අයිතිය සම්බන්ධයෙන් අදාල කටයුතු නිරවුල් කරන ලෙස 2021 මැයි 06 දිනැතිව ප්‍රාදේශීය ලේකම් හෝමාගම වෙත ඉල්ලුම් කර ඇති අතර, 2021 අගෝස්තු 17 වන දින ඉඩමේ අයිතිය පවරා ගැනීම සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙතද ඉල්ලුම් කර ඇත. එකී ඉල්ලීම් වලට ප්‍රතිචාර වශයෙන් 2022 මාර්තු 03 වන දින හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රැස්වීමක් කැඳවන ලද අතර ප්‍රාදේශීය ලේකම් විසින් එම කටයුතු සිදු කිරීමට ක්‍රියා කරන බව දැනුම් දෙන ලදී. | නීත්‍යානුකූල අයිතිය කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය වැරදි ලෙස අර්ථකථනය කරමින් NDT පාඨමාලාව වෙනුවෙන් ශිෂ්‍යයින්ගෙන් අයකරනු ලැබූ අයදුම්පත් ගාස්තුවෙන් චක්‍ර වියදම් ලෙස සලකා 2020 හා 2021 වර්ෂ තුළදී පිළිවෙලින් රු.340,823 ක් හා රු.663,180 ක් සේවක දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීමක් සිදු නොකෙරේ.<br><br>සිසුන් තෝරා ගැනීම හා ලියාපදිංචිය ඇතුළු සම්පූර්ණ ක්‍රියාපටිපාටිය සඳහා මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ සියළුම කාර්යමණ්ඩලයේ සහභාගිත්වය යෙදවිය යුතුව ඇත. එසේ හෙයින් මේ ක්‍රියාවලිය සඳහා අයදුම්පත් ගාස්තුවක් ශිෂ්‍යයින් අයදුම්පත් යොමු කිරීමේදී අයකෙරේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4** අරමුදල් ඌන උපයෝජන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල් ස්ථාපිත කළ දින සිට වසර 10 කට වැඩි කාලයක් ගතවී තිබුණු එකතුව රු.8,125,524 ක් වූ අරමුදල් 03 ක් හා වසර 04 කට වැඩි කාලයක් ගතවී තිබුණු රු.955,030 ක් වූ අරමුදලක් සමාලෝචිත වර්ෂය තුළදීද අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම අරමුදල් වලින් රු.5,842,405.00 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය වී ඇති අතර, තවදුරටත් රු.3,238,149.00 ක මුදලක් අදාල අංශ වලින් වියදම් දැරිම සඳහා ඉල්ලුම්පත් ලැබෙන තුරු ස්ථාවර තැන්පතුවල ආයෝජනය කොට ඇත. | අරමුදල් ඇතිකර ගැනීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |